# දයානන්ද ගුණවර්ධනගේ මධුර ජවනිකා නාට්‍යය කෙරෙහි වූ සමාජ සංස්කෘතික බලපෑම

කුසුම් හේරත්

The study of dramas created by the artist Dayananda Gunawardene reveals that he had close reletionship with the common people of the society for the fullfilment of his aspiration. His creations cover many streams such as cultural, social, religious,economical and political. These features are more illustrated in late creations than in early creations. This is an attempt to discuss the social influence in the creation of drama "Madura Javanika."

සමකාලීන සමාජ ගැටලු ප්‍රතිනිර්මාණය කිරීම කලාකරුවා සතු වගකීමක් වේ. එහි දී සාහිත්‍ය නිර්මාණයක අනන්‍යතාව ඉස්මතු කෙරෙන්නේ කලාකරුවා විසින් ම සොයා පාදාගන්නා සමාජ තොරතුරු ඔස්සේ ය. කවර ලේඛකයෙකුට වුව ද, සමකාලීන සමාජ බලවේගයන්ගෙන් ඈත් වී උසස් වූ ද, අර්ථවත් වූ ද, නිර්මාණ කළ නො හැකි ය. සැබෑ සාහිත්‍ය නිර්මාණයකින් එක් අතකින් අවංකවත්, පැහැදිලි ලෙසත්, මිනිස් ජීවිතයේ සත්‍යය පිළිබිඹු කෙරෙන අතර, අනෙක් අතින් එම කෘතිය පහළ කළ සමාජයෙහි ක්‍රියාත්මක වන්නා වූ විවිධාකාර බලවේග ද පිළිබිඹු වෙයි. උසස් නිර්මාණ සාහිත්‍යයෙහි විශේෂත්වය නම් ලේඛකයා ගවේෂකයෙකු ලෙස සත්‍යය සොයා යෑමයි. සාහිත්‍ය නිර්මාණ මගින් ප්‍රකාශ කෙරෙන සත්‍යය වනාහි එක් එක් පුද්ගලයා හෝ සිද්ධිය හෝ පිළිබඳ සත්‍යය නො ව පොදු සමාජය පිළිබඳ සත්‍යයකි. මිනිසා පිළිබඳ සත්‍යයකි. කිසියම් නිර්මාණයක් සර්වකාලීන වැදගත්කමකින් යුක්ත වන්නේ එම නිර්මාණයෙහි අන්තර්ගත සත්‍යය පදනම් කරගෙන ය.[1] සත්‍යය ප්‍රතිනිර්මාණය කිරීම සඳහා නිර්මාණකරුවා මනා ශික්ෂණයකින් යුක්ත ව තොරතුරු ගවේෂණය කළ යුතු ය.

© ආචාර්ය කුසුම් හේරත්

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය



ගුණවර්ධනගේ නාට්‍ය නිර්මාණ විමසන කල්හි ඔහු සිය පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා සමාජය ඇසුරෙන් ලද ආභාසය හඳුනාගත හැකි ය. එම නිර්මාණ මගින් සාමාජික, සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික ආදී විවිධ විෂය ක්ෂේත්‍ර නියෝජනය කෙරෙයි. මුල්කාලීන ව ගුණවර්ධන අතින් නිර්මාණය වූ නාට්‍යයන්ට වඩා 70' - 80' දශකවල නිෂ්පාදනය වූ නාට්‍යයන්හි මෙම තත්ත්වය මනා ව හඳුනාගත හැකි ය. මෙහි දී අපගේ අවධානයට විෂය වන්නේ ගුණවර්ධනගේ **මධුර ජවනිකා** නාට්‍යයෙහි සමාජ බලපෑමයි. **මධුර ජවනිකා** ස්වතන්ත්‍ර නිර්මාණයකි. මෙය වාර්තා රංග නම් නාට්‍ය සම්ප්‍රදායට අයත් ය. මේ සඳහා එපික් රංග සම්ප්‍රදායේ ආභාසය ලැබී ඇත. විෂය වී ඇත්තේ ලක්දිව සංස්කෘතික විපරිණාමයයි.

උසස් සංස්කෘතියක් හිමි සිංහලයෝ අතීතයේ සිට ම සමාජ සාරධර්ම අගයමින් ජීවත් වූහ. ඒ මගින් අන්‍යෝන්‍ය සහයෝගය හා සමගිය වර්ධනය විය. කලාව මගින් මිනිස් සාරධර්ම හා සංස්කෘතිය පෝෂණය කළ හැකි ය. බෞද්ධ සාහිත්‍යයෙහි අන්තර්ගත ලක්ෂණ ඒ හා බැඳී පවතී. පොදුවේ විමසා බලන කල්හි පැහැදිලි වන කරුණක් වන්නේ බොහෝ කලාකරුවන් සිය නිර්මාණ මිනිස් සමාජයට වැදගත් සමාජ බද්ධ සංස්කෘතික හරයන්ගෙන් පෝෂණය කරන බවයි. ගුණවර්ධන සිය නාට්‍ය නිර්මාණ මගින් සමාජ සාරධර්ම හා සංස්කෘතිය පෝෂණයෙහිලා කටයුතු කළේ ය. ඒ බව ඔහුගේ **මධුර ජවනිකා** නාට්‍යය මගින් පැහැදිලි වෙයි.

**මධුර ජවනිකා** නාට්‍යය මගින් ගුණවර්ධන සිංහල සංස්කෘතිය හා සම්බන්ධ තොරතුරු රැසක් අනාවරණය කරයි. ඒ අතර ජාතියෙහි ආරම්භය මෙන් ම කලින් කල ඇති වූ විවිධ බලපෑම් හේතුවෙන් සංස්කෘතියෙහි ඇති වූ වෙනස්කම් අන්තර්ගත ය. මෙම නාට්‍යයෙහි ජවනිකාවෙන් ජවනිකාවට වෙනස් අවස්ථා නිරූපණය වෙයි. එසේ වුව ද ඒවා දම්වැලක පුරුක් මෙන් සමස්තාර්ථය හා බද්ධ වෙමින් අතීතයේ පැවති සාරධර්මයන්හි වටිනාකම් මතු කර දක්වයි. අධිරාජ්‍යවාදී පාලනය මෙන් ම 1978 වර්ෂයේ විවෘත ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක වීමෙන් මෙරට සමාජයෙහි ඇති වූ ඇතැම් වෙනස්කම් සංස්කෘතිය කෙරෙහි බලපෑවේ අයහපත් අන්දමිනි. එයට හේතුව බටහිර

සංස්කෘතිකමය ලක්ෂණ මෙරට සංස්කෘතිය හා මිශ්‍ර වීමයි. ගුණවර්ධන ජනප්‍රවාද හා පුරාවෘත්ත පරිශීලනයෙන් වස්තුබීජ සපයාගනිමින් අතීතයෙහි හා වර්තමානයෙහි වෙනස ප්‍රේක්ෂකයන්ට ඥානනය කරවනු වස් **මධුර ජවනිකා** ප්‍රයත්නයක් කරගත් බව නාට්‍යය සියුම් ව නිරීක්ෂණය කරන කල්හි පැහැදිලි වේ. මෙරට මුල්බැස පැවති සාරධර්ම පරිහානියත්, සිංහල සංස්කෘතිය වෙනුවට ජනප්‍රිය සංස්කෘතිකාංග එක්වීමත්, සංගීත ක්ෂේත්‍රයෙහි පිරිහීමත් ගැඹුරින් විවරණය කෙරෙන අවස්ථාවක් වශයෙන් උක්ත නාට්‍යය සැලකිය හැකි ය.

ගුණවර්ධන මෙහි දී ප්‍රයෝජනයට ගෙන ඇත්තේ සිංහල ජන සමාජයෙහි ආධ්‍යාත්මය පෝෂණය කළ මූලික ස්ථරයන් ය. එනම් සිංහලයන් ජාතියක් වශයෙන් මුහුණ දුන් විවිධ ගැටලු තෝරාබේරා ගැනීමෙන් යුක්ත ව නාට්‍යයෙහි පෙළගස්වා ඇත. තම පරමාර්ථය ප්‍රේක්ෂකයන්ට අවබෝධ කරවනු වස් ගුණවර්ධන නාට්‍යයෙහි අවස්ථා අතරතුර උපදේශාත්මක පාඨ ඉදිරිපත් කළේ ය. එසේ ම නාට්‍යය මගින් අතීත තොරතුරු මෙන් ම වර්තමාන සමාජ ගැටලු ද අනාවරණය කෙරෙයි.

ගුණවර්ධන **මධුර ජවනිකා** නාට්‍යයේ ආරම්භක අංකය මගින් ලාංකේය ප්‍රෞඪ ඉතිහාසයෙන් බිඳක් මතු කරයි. රාවණා රජු මහත් බලපරාක්‍රමයක් සහිත රජ කෙනෙකු වශයෙන් ප්‍රකට ය. එතුමා සිය ශක්තිය මෙහෙයවා දඬුමොනරය නම් උපකරණයක් නිර්මාණය කර ගුවනින් ගමන් කිරීමට සමත් වූයේ ය. එපමණක් නො ව, සිය බලය පෙන්වීම සඳහා ඉන්දියාවේ රාම රජුගේ බිසව වූ සීතා කුමරිය පැහැරගෙන ඒමට ද එරජ බලසම්පන්න වූයේ ය. රාම රාවණා හා සම්බන්ධ එම පුරාවෘත්තයට අනුව සිය ජාතිය විදේශිකයන්ට පාවා දීම සඳහා කටයුතු කළේ රාවණාගේ සොහොයුරු විභීෂණ ය. නාට්‍යකරුවා ඒ හා බැඳුණු තොරතුරු කථක හා ලොකුරුගේ මාර්ගයෙන් විස්තර කරයි.

කථකː ඒ වුණාට ඉවසන්න බැරි කාරණේ මේකයිනෙ රාවණා රජ්ජුරුවො පැරැද්දුවෙ තමන්ගෙ ම සහෝදරයා විභීෂණ. රාම කුමාරයාට එක්කහු වෙලා විභීෂණ පාවලා දුන්නෙ රාවණා නෙවෙයි අපේ ජාතිය...[2]



උසස් සංස්කෘතියක් හිමි ව පැවති සිංහල ජාතියෙහි වර්තමාන පරිහාණිය **මධුර ජවනිකාහි** අවසන් අංකයෙන් නිරූපණය කෙරෙයි. එහි ඇතුළත් වන්නේ වහල් මෙහෙය සඳහා ලාංකේය කතුන් මැදපෙරදිග යාම හා බැඳුණු තොරතුරු ය. ඒ හේතුවෙන් මතු වී ඇති සමාජ ගැටලු රාශියකි. දරුවන් හදාවඩා ගැනීමේ දී පැරණි සිංහල කුලකත තුළ පැවති උතුම් මාතෘත්වය විදේශගත වන කාන්තාවගෙන් අපේක්ෂා කිරීම අසීරු ය. ඇතැම් විටෙක ඇයට දරුවන්ට සෙනෙහස හා උණුසුම ලබා දී සතුටින් නිවසේ සිටීමට අවකාශ නො ලැබේ. එයට හේතුව විවිධ ආර්ථික ගැටලුවලට විසඳුම් සොයා විදේශගත වීමට සිදුවීමයි. එබඳු රැකියාවකට ගොස් ලංකාවට පැමිණෙන කාන්තාව සුපුරුදු ගුණාංගයන්ගෙන් ඈත් ව විලාසිතා අගයන සුන්දරත්වය ආරක්ෂා කර ගැනීම සඳහා වෙහෙසෙන සුකුමාල කාන්තාවක් බවට පත්වීම මහත් ඛේදයකි. ඇයට දාරක ස්නේහය අමතක වීමත්, මුදලට මුල්තැන ලැබීමත් ඇතැම් අවස්ථාවල දී අසන්නට ලැබෙන සිදුවීම් ය. එයින් දරුවෝ අසරණ වෙති. මෙම සියලු කරුණු ඉදිරියේ පරිහානියට පත්වන්නේ සිංහල ජන සමාජයෙහි මුල් බැස පැවති උසස් සංස්කෘතික අංග ය. දෙමාපියන් විදේශගත වීමෙන් ආර්ථිකය ශක්තිමත් කර ගත්ත ද දෙමාපිය, දූදරු සබඳතා ළිහිල් වෙමින් මානව දයාව ගිලිහී යාමට එය ප්‍රධාන හේතුවක් වෙයි. ඒ මගින් දෙමව්පියන්ට නොසලකන දරුවන් බිහිවීමත්, දෙමාපියන් අසරණ වීමත්, මහලු නිවාස බිහිවීමත් වැළැක්විය නොහැකි ය. නාට්‍යකරුවා අවුරුදු දෙදහස් පන්සියයක් පමණ ඈත අතීතයත්, වර්තමානයත් එකට සම්බන්ධ කරමින් සමාජ සාරධර්ම හා සංස්කෘතිය පරිහානිය සිදු වූ ආකාරය මුල් අංකයේ සිට අවසන් අංකය දක්වා සියුම් ව අනාවරණය කරන්නේ ඒ ආකාරයෙනි. ඒ අතර නිරූපණය කෙරෙන සියලු අංක මගින් මෙරට විවිධ සමාජ ගැටලු සාකච්ඡාවට භාජනය කෙරෙයි.

මෙම නාට්‍යයෙහි මහමඟ දමා ගොස් සිටිය දී කථකට දරුවකු හමුවීම සංස්කෘතිය පරිහානියෙහි ස්වරූපය අනාවරණය කෙරෙන අවස්ථාවක් වශයෙන් සැලකිය හැකි ය. බිළිඳු දරුවන් මහමඟ දමා යාමට තරම් සාහසික සිතිවිලි මව්වරුන්ගේ සිත්වල හටගත්තේ කෙසේ ද යන්න නාට්‍යකරුවා නඟන ප්‍රශ්නයයි. එසේ ම නාට්‍යකරුවා

දරුවාට වංශවතී යන නම යෙදීම මගින් ද ජාති, ආගම්, කුල හා පන්ති භේද නොසලකා මානව දයාව පෙරදැරි ව එකමුතු වීමේ අවශ්‍යතාව මතු කරයි. එබඳු හරපූර්ණ සංකල්ප නාට්‍යය මගින් අනාවරණය කිරීම කෙරෙහි නාට්‍යකරුවා පොළඹවන්නේ පරිහානියට පත්වෙමින් පවත්නා සාරධර්ම හා සංස්කෘතික සංකල්ප ය.

ශ්‍රී ලංකාවෙහි උසස් ආගමික ස්ථානයක් වූ කැලණි විහාරය වන්දනා කිරීම මගින් ජීවිත කාලය මුළුල්ලේ ම සිදු කළ පව්වලින් නිදහස් විය හැකි ය යන පාරම්පරික මතයක් පවතී. නාට්‍යකරුවා පූර්වෝක්ත නාට්‍යය මගින් එම කරුණ සියුම් ව විවරණය කරයි. කාලීන සමාජ අවශ්‍යතාවක් වන්නේ හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් ජීවත් වීමයි. එසේ නො වී ආගම ධර්මය නොසලකා හිතුමතේ කටයුතු කිරීමෙන් විවිධ ගැටලු ඇති විය හැකි ය.

කථක: ලෝකුරු උන්නැහෙගේ සිංදුව නම් හොඳයි. නමුත් ඒ කව්වල මිනිස්සුන්ට හරි උපදේශයක් තියෙනවද කියලා අවිශ්වාසයි. ඒ මොකද ඕනෑ තරම් පව් කරලා වරක් කැලණිය වැන්දොත් ඒ පව් නැතිවෙලා යනවා කියලනෙ කියන්නෙ.

ලෝකුරු: උපන්දා සිට ම කරපු පිං පව් මෙව්වයි කියලා හරියට තෝරලා බේරලා අරගෙන කැලණියට ගිහිං වැඳලා ඒ බව කියන්න පුළුවන් ශක්තියක් ඇති කරගත්ත කෙනාට මං හිතන්නෑ ඕක කරගන්න එක ඒ තරම් අපහසු වෙයි කියලා. ඉතිං ඒකට හිත දියුණු කරගන්න ඕනෑ. නිකං වැන්දට ම බැහැ.

කථක: ඒ කියන්නෙ ලෝකුරු උන්නැහෙගෙ කවියත් නිකම් මේ ආවට ගියාට කියපු එකක් නෙවෙයි. ටිකක් බැරෑරුම් තේරුමක් තියෙන කවියක්. හුඟ දෙනෙක් හිතන්නෙ මෙව්වා මේ මෝඩ උපාසකයන්ගෙ කවි කියලා. නමුත් එව්වා ගැන ටිකක් හිතලා බලපුවාමයි පේන්ඩ තියෙන්නෙ අදහස කොහොමද කියලා.[3]

පැරණි සාම්ප්‍රදායික කියමන් හර ශූන්‍ය ඒවා ලෙස සැලකීම ඇතැම් විට සමාජයෙහි දක්නට ලැබෙන ලක්ෂණයකි. එවැනි එක් කියමනක් නාට්‍යයට අන්තර්ගත කර තාර්කික පදනමක් මත පිහිටා එහි සත්‍ය-අසත්‍යතාව ප්‍රේක්ෂකයාට අවබෝධ කරවීමට නාට්‍යකරුවා මෙ මගින් අවස්ථාව සලසාගෙන ඇත. ඒ ආශ්‍රයෙන් ආගමක ඇති වැදගත්කමත්, ආගම මිනිසා යහපත් මාර්ගයන්ට



අවතීර්ණ කරවන උසස් සංස්කෘතික අංගයක් ය යන්නත් මතු කර දක්වයි.

සංගීතය සිංහල සංස්කෘතියෙහි වැදගත් අංගයකි. ඒ මගින් මිනිසුන්ගේ මානසික පීඩන අවම කරගත හැකි ය. එහෙත් කලින් කල පෙරදිග සම්භාව්‍ය සංගීත ක්ෂේත්‍රයට බටහිර අනුකරණවාදී සංගීත අංග එක්වීමෙන් එය පරිහානියට ලක්වෙමින් පවතී. එය ක්ෂණික ව සිදු කෙරෙන්නක් නො වේ. ක්‍රම ක්‍රමයෙන් දේශීයත්වය විනාශ කරන්නකි. බටහිර දක්නට ලැබෙන ඇතැම් වේග රිද්ම හේතුවෙන් තරුණ මනස ප්‍රවේගකාරී සිතුවිලි කෙරෙහි යොමු කරවයි. එය සංස්කෘතිය පරිහානිය කරා මෙහෙයවන එක්තරා අංගයක් යන්න ද නාට්‍යයෙහි ඇතැම් අවස්ථා අනුසාරයෙන් නිරූපණය වේ.

සිංහල සංස්කෘතිය කෙරෙහි ද්‍රවිඩ සංස්කෘතියෙන් ඇති කෙරුණු බලපෑම් ද ඈත අතීතයේ සිට ම දක්නට ලැබෙන්නකි. එය දේව ඇදහිල්ලෙන් අනාවරණය වේ. පොළොන්නරු යුගයේ සිට හින්දු දේව සංකල්පය සම්බන්ධ දෙවිවරුන් ඇදහීම බුදුදහමට සමගාමී ව වර්ධනය වූ අතර ගැටුමකින් තොර ව සිංහල හා ද්‍රවිඩ ජනයා අන්‍යෝන්‍ය ඇදහිලි හා විශ්වාස අගයමින් ජීවත් වූ හ. නාට්‍යකරුවා ඒ බව අනාවරණය කරන්නේ පත්තිනි හා දෙවොල් දෙවි ඇදහීම ලාංකේය ජනතාව වැළඳගත් ආකාරය මතුකර දැක්වීමෙනි. ඔහු ඒ මගින් අවධාරණය කරන්නේ වර්තමාන ජාතිවාදී අරගලය හර ශූන්‍ය වූවක් බවයි. අවශ්‍ය වන්නේ සංස්කෘතික සම්මිශ්‍රණය වඩාත් හරවත් කරගෙන අන්‍යොන්‍ය සහජීවනයෙන් ජීවත් වීමයි. මෙහි දී එළාර රජුගේ චරිතය භාවිතයට ගෙන ඇති අතර එළාර රජු සිහිවීම සඳහා දුටුගැමුණු රජු විසින් කරවන ලද එළාර සොහොන පිළිබඳ කරුණු අනාවරණය කිරීමෙන් පැරණි ලාංකේය රජදරුවන්ගේ ශිෂ්ට සම්පන්න චර්යාවන් ඇගයීමකට ලක් කළේ ය.

වැඩි ජනගහනයක් සහිත ජන කොටස වූ සිංහලයන්ට ඈත අතීතයේ සිට ම එළාර රජ පවා ප්‍රමුඛත්වය ලබා දුන්නේ ය. ඒ

කෙරෙහි අවධානය යොමු කිරීම මගින් නාට්‍යකරුවා වර්තමානයේ දී එම තත්ත්වය අපේක්ෂා කරන බව පැහැදිලි වේ. ඔහුගේ පරමාර්ථය වන්නේ සිංහල බෞද්ධ රටේ සිංහල ජාතියට මෙන් ම ආගමට ප්‍රධානත්වය ලැබීම වැදගත් බව අනාවරණය කිරීමයි. එහෙත් අන්‍ය ජාතීන් නොසලකා හැරිය යුතු බව එයින් ගම්‍ය නො වේ. ඔහු නාට්‍යය මගින් නිරතුරු ව ජාතීන් අතර සහයෝගය අගය කළේ ය.

එළාරඃ මං ඉස්සරවෙලා පටන් ගන්නම් සිංහලෙන්.
කථකඃ මොනවා ඇත්තට ... ඔබවහන්සේ නම් පුදුමයි.
එළාරඃ පුදුම වෙන්න දෙයක් නෑ. මං රාජකාරි කරපු කාලෙ ඔය ප්‍රතිපත්තිය ම තමයි මං අනුගමනය කළේ. සිංහල මිනිස්සු වැඩියෙන් ඉන්න රටේ සිංහලයාට මුල්තැන දෙන්න ඕනෑ නෙ.
කථකඃ මට නම් පුදුමෙනුත් පුදුමයි.
එළාරඃ මටත් පුදුමයි තමුසෙ සිංහලයෙක් වෙලා ඕකට පුදුම වෙන එක ගැන.
කථකඃ ඔබතුමාගෙ සිංදුවෙ මාතෘකාව මොකද්ද?
එළාරඃ මම කියන්න යන්නෙ අපේ පත්තිනි මෑණියන් ගැන. ඒත් ඒක පටන් ගන්නේ බුදු හාමුදුරුවන්ගෙ ගුණ සිහිකරලා. ඒ මොකද රටේ වැඩියෙන් ම ඉන්නෙ බෞද්ධයොනෙ. ඒකත් අපි සලකන්න එපායැ.
කථකඃ ඔබවහන්සේ නම් ඇත්තට ම පුදුමයි.
එළාරඃ ආයෙත් ඉතින් පුදුම කථාවක් ඇදලා ගත්ත. ඕක තමයි සිංහල මිනිසුන්ගෙ වැරැද්ද, සිහි කල්පනාව නැති එක. මතක නැද්ද? මගෙ ගුණ යහපත්කම ගැන මතක් වෙන්න අනුරාධපුරයේ එළාර සොහොන බැන්ද හැටි දුටුගැමුණු රජ්ජුරුවො.
කථකඃ අනේ ඒක නේන්නම් ඔබවහන්සේව මරණයට පත් කරපු එක දැං නම් මට වැටහෙන්නේ අපි කරපු බරපතල වරදක් කියලා.
එළාරඃ දැං ඉතින් ඔය පහුගිය ඒවා ගැන කල්පනා කරලා වැඩක් නෑ. ඉදිරියටවත් හිතේ තියාගන්නවා හොඳයි. එහෙනම් අපි සිංදුව පටන් ගම්මු... හඬේ හා රූපෙන් කියවෙන්නේ බුදුහාමුදුරුවන්ගේ ශ්‍රේෂ්ඨතම පරිත්‍යාලශීලී බවයි. අපේ පත්තිනි මෑණියොත් ඒ අනුව තමයි කටයුතු කළේ ......[4]

කිනම් ආගමක වුව ද, මතුකෙරෙන උසස් සංකල්ප අගය කළ යුතු බවත්, බුදුදහමේ ශ්‍රේෂ්ඨ සංකල්ප දේව ඇදහිලිවල ද ඇගයීමට



ලක්වන බවත් මෙයින් අනාවරණය වේ. එසේ ම, අතීතය ආදර්ශයට ගෙන වර්තමානය සකස් කරගත යුතු බව මේ මගින් මතු කෙරේ.

ජාති, ආගම් හා කුල භේද නොසලකා මනුෂ්‍යත්වයෙන් ජීවත් වීමට මෙබඳු අවස්ථා නිරූපණ මගින් නොමඳ ආලෝකයක් ලබාගත හැකි ය. ඒවා සමාජ අවශ්‍යතා හඳුනා ගනිමින් ගොඩනඟන ලද අවස්ථා නිරූපණ වශයෙන් සැලකිය හැකි ය.

ලාංකේය ජනතාව විදේශයන්ට ගැති වෙමින් එහි විවිධ සංකල්ප අගය කරමින් ජීවත්වීමට උත්සාහ කිරීම මගින් ජන සමාජයෙහි ගැටලු රැසක් නිර්මාණය වී ඇත. දේශීයත්වය විනාශ වීමත්, ආර්ථිකය බිඳ වැටීමත්, සංස්කෘතිය පරිහානියට පත්වීමත් ඒ අතර ප්‍රධාන වෙයි. **මධුර ජවනිකා** නාට්‍යයෙහි නිරූපණය කෙරෙන ඇතැම් කරුණු මගින් තත්කාලීන ජන සමාජය දේශීයත්වය අගය කිරීම කෙරෙහි ප්‍රේක්ෂකයා ඥානනය කිරීම සිදු කෙරෙයි. එළාර රජුගේ චරිතය ආශ්‍රයෙන් කරන විස්තරය ඒ සඳහා නිදසුන් ලෙස සැලකිය හැකි ය.

කථකඃ ... පත්තිනි දේවීන්වහන්සේගේ හලඹට ඔබ්බලා තියෙන්නෙ අපේ ලංකාවෙ මැණික්.
එළාරඃ ඔව් දැන් තේරෙනවානේ ලංකාව කොච්චර වටිනව ද කියලා.
කථකඃ ඒ කිව්වෙ අපේ මැණික්.
එළාරඃ මැණික් විතරක් නෙවෙයි ලංකාවෙ කොච්චත් වටිනවා. ලංකාවේ මිනිස්සුන්ට ඒක තේරෙන්නෙ නැතුවට.
කථකඃ ඒක නම් ඇත්ත දේවයන් වහන්ස. මේ පිටරට බඩු ගේන්න පටන් ගත්තට පස්සේ අපේ මිනිස්සුන්ට මේ දේවල් ගැන කිසිම ඕනෑකමක් නෑ.
එළාරඃ නෑ. මං කියන්නෙ ඕනෑ කරන හොඳ පිටරට බඩු ගත්තට කමක් නෑ.[5]

විදේශයන්ගෙන් මෙරටට ලැබෙන සියලු දේ අත්හළ යුතු නොවන බවත්, දේශයට උචිත දේ අවබෝධයෙන් ලබා ගැනීම වඩාත් වැදගත් බවත් මේ මගින් අනාවරණය වේ. උක්ත කරුණු සම්බන්ධයෙන් ජන සමාජය ඥානනය කිරීම මගින් හෙළ සංස්කෘතිය ආරක්ෂා කිරීම නාට්‍යකරුවාගේ අපේක්ෂාව වී ඇත.

ලාංකේය ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ආරම්භ කෙරුණු සංචාරක ව්‍යාපාරය මගින් ආර්ථික වශයෙන් වාසි රැසක් අත්වුව ද ඒ මගින් ඇති කෙරුණු සංස්කෘතික පරිහානිය අතිවිශාල ය. එය ජන සමාජයේ සෑම ස්තරයක් කෙරෙහි ම ඍජු හෝ වක්‍ර ලෙස බලපෑ හැකි ය. පූර්වෝක්ත නාට්‍යයෙහි කුඩුම්භර යක්ෂයින් හා කථක අතර කෙරෙන සංවාදයක මාර්ගයෙන් මෙම කරුණු අනාවරණය වේ. ඒ අතර විදේශිකයන්ගේ අයථා හැසිරීම්වල ස්වරූපය ද වේදිකාවේ නිරූපණය කෙරේ. ඒ මගින් සංචාරක හෝටල් ආශ්‍රිත සිදුවීම් මතුකර දැක්වේ. කථක එය ගිනි තබා විනාශ කළ යුතු බව ප්‍රකාශ කළ අවස්ථාවේ කුඩුම්බර යක්ෂයින් පවසන්නේ එය විනාශ කිරීමෙන් ආර්ථික වාසි රැසක් ලැබෙන ව්‍යාපාරයක් පරිහානියට පත්වන බවයි. නාට්‍යකරුවා මෙහි දී එම ව්‍යාපාරය අප සංස්කෘතියට උචිත වන පරිදි යම් යම් සීමාවන් තුළ පවත්වාගෙන යාම ඉතා වැදගත් බව අනාවරණය කරයි.

2 වන කුඩුම්බරයාඃ දැනගන්ඩ හොඳයි වර්තමාන සීනිගම් වෙරළ කියන්නෙ හික්කඩුවෙ වෙරළට. ඒකට ගින්දර ගැහුවොත් ගින්දර තියන්නෙ ලංකාවෙ ලොකු ම ආදායම් මාර්ගයකට. මේ හික්කඩුවෙ හෝටල්වලට ගිනි තියන්න ද හදන්නෙ.

දරුවන් වහල් මෙහෙයට විකිණීම ද මෙරට සමාජයෙහි දක්නට ලැබෙන ගැටලුවකි. **මධුර ජවනිකා** නාට්‍යයෙහි අවසන් අංකය මගින් ඒ හා බැඳුණු කරුණු අනාවරණය වේ. එහි ඇතුළත් ඩුබායි ළඳගේ චරිතය මගින් විදේශගත වන කාන්තාවන්ගේ ස්වරූපය මතු වෙයි. ඇය කථකගෙන් ඉල්ලන්නේ මහ මඟ දී හමු වූ දැරිවිය ඇයට හදාගැනීමට දෙන ලෙස ය. දරුවන් හදාවඩා ගන්නේ යැයි පොරොන්දු වී කිරි දරුවන් මුදලට විකුණන ඇතැම් කාන්තාවන්ගේ සාවද්‍ය චර්යාවන් මේ මගින් මතු කර දැක්වෙයි.

කාන්තාවඃඔය මොකෙද්ද සතෙක් ද නළවන්නෙ.
කථකඃ නෑ ළමයෙක් ඇයි එහෙම ඇහුවෙ.
කාන්තාවඃනෑ මේ සතුන්ට දෙන කෑම ගැන විස්තරයක් කරපු හින්දයි ඇහුවෙ.
කථකඃ මොනවා කරන්න ද හරියට සතෙක් වගෙ තමයි මේ ළමයව කවුදෝ මහ පාරේ දාලා ගිහිල්ලා තිබුණෙ.



කාන්තාවඃමොකක්ද මේ ළමයගෙ නම.
කථකඃ මං දැම්ම හොඳ නමක්. වංශවතී කියලා. නරක ද ඒක.
කාන්තාවඃලස්සනයි නම. මට දෙන්න බැරි ද වංශවතීව හදාගන්න.
කථකඃ ඔව් අපි කවුරුත් එක්ක එකතු වෙලා වංශවතීව හදාගන්න ඕනෑ තමයි.[6]

උසස් සංස්කෘතියකට උරුමකම් කී සිංහල ජන සමාජයෙහි වර්ධනය වෙමින් පවත්නා සාරධර්ම පරිහානිය මහ මඟ දී හමුවන දරුවාගෙන් සංකේතවත් වී ඇත. එබඳු අනාථ දරුවකු සියලුදෙනා ම එක් ව හදාවඩා ගත යුතු බව දැක්වීම මගින් නාට්‍යකරුවා සියලු ජාති කුල ආගම් භේද නොසලකා එක්වීමේ අවශ්‍යතාව අවධාරණය කරයි.

**මධුර ජවනිකා** මගින් අතීතයෙහි පැවති ලාංකේය සශ්‍රීකත්වය හා සෞභාග්‍ය ද මතු කෙරෙයි. වර්තමානය වන විට එම තත්ත්වය වෙනස් වී බොහෝ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය විදේශයන්ගෙන් ගෙන්වීමට සිදුවීම ද සිංහල සංස්කෘතිය පරිහානිය කරා ගමන් කිරීමකි. එය රටේ අනාගතය වඩාත් දුර්භාග්‍ය ස්වරූපයකට පත්වීමක් සේ මෙහි නිරූපණය වන්නේ ය. නාට්‍යයෙහි නිරූපිත ලාංකේය කතට ඇති වන දොළදුක අනුව ඇයට සිංහල හාලේ බත් අනුභව කිරීමට සිත් වෙයි. එහෙත් ඇගේ සැමියා මහත් ශෝකයට පත්වන්නේ ඒ සඳහා සිංහල ඇල් සහල් සොයාගැනීමට නොහැකි බැවිනි. සිංහල ජන සමාජයට අනන්‍ය බොහෝ සම්පත් අපෙන් ඈත්වීම ද නාට්‍යයෙහි නිරූපණය වන බව මේ මගින් පැහැදිලි වේ.

ජීවිතයේ පවත්නා අනිත්‍ය සහගත ස්වරූපය අනාවරණය කෙරෙන අවස්ථාවක් වශයෙන් **මධුර ජවනිකා**හි මහලු කාන්තාවගේ චරිතය හඳුනාගත හැකි ය. එහි දී ක්‍රමයෙන් වෙනස් වන ජීවිත යථාර්ථය නිරූපණය වෙයි. ජීවිතයේ අවසන් භාගයේ දී එනම් මියයන මොහොතේ ඊළඟ ආත්මය උදෙසා කිසියම් පුණ්‍යකර්මයක් සිදුකර තිබීමේ වැදගත්කම එම චරිතයෙන් අනාවරණය කෙරේ. මේ මගින් ද මතු කෙරෙන්නේ යහපත් සමාජ ජීවිතයක ඇති වැදගත්කමයි.

සමස්තයක් වශයෙන් ගෙන බලන කල්හි **මධුර ජවනිකා** නාට්‍යයෙහි වසර දෙදහස් පන්සියයක් තරම් කාල වකවානුවක සිදු

වී ඇති සංස්කෘතික සම්මිශ්‍රණය අන්තර්ගත වෙයි. එය පොදුවේ සිදු කෙරෙන්නකි. එනම්, උක්ත නාට්‍යය සමස්ත ජන සමාජය ම නියෝජනය කරයි. වර්තමාන ජන සමාජයෙහි උග්‍ර අර්බුදයක් වී ඇති ජාතිවාදී අරගලයෙහි නිරර්ථක ස්වරූපය ද මෙහි දී මතු කෙරෙන අතර සියලු භේද දුරලා රටක් වශයෙන් එකමුතු වීමේ වැදගත්කම අනාවරණය වේ. ඒ සඳහා ඔහු යොදාගෙන ඇත්තේ අතීත ජන සමාජයයි. එදා මෙදා තුර ජන සමාජයේ වෙනස්වීම සමකාලීන සමාජයට උචිත පූර්වාදර්ශ සැපයීමට සුදුසු වන පරිදි විකාශනය කිරීමට නාට්‍යකරුවා සමත් වී ඇති බව මෙයින් පැහැදිලි වේ.

**ආන්තික සටහන්:**

1. සුරවීර ඒ. වී., සමාජ සාහිත්‍ය අධ්‍යයනය, කොළඹ, (1984), 54 පිටුව.
2. මධුර ජවනිකා, (1984), 10 පිටුව.
3. මධුර ජවනිකා, (1984), 11 පිටුව.
4. මධුර ජවනිකා, (1984), 20-21 පිටු.
5. මධුර ජවනිකා, (1984), 23 පිටුව.
6. මධුර ජවනිකා, (1984), 24 පිටුව.

**ආශ්‍රිත ග්‍රන්ථ:**

අබේපාල, රෝලන්ඩ්, (1987) **ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව**, කොළඹ.

කවිරත්න, ආනන්ද, (1958), **නව නාට්‍ය තාරකා**, කොළඹ.

ගුණවර්ධන, දයානන්ද, (1984), **මධුර ජවනිකා**, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

දිසානායක, විමල්, (1971), **ගිරිකුළ හා සඳමඬල**, කොළඹ.

පල්ලියගුරු, චන්ද්‍රසිරි, (1993). **යථාර්ථය හා නිර්මාණය**, කොළඹ.

සරච්චන්ද්‍ර, එදිරිවීර, (1959), **කල්පනා ලෝකය**, කොළඹ.

සිල්වා, වයි. සුගතපාල, (1969), **නූතන සිංහල නාට්‍ය**, කොළඹ.

සුරවීර, ඒ. වී., (1984), **සමාජ සාහිත්‍ය අධ්‍යයනය**, කොළඹ.

# A Critical Analysis of the Reliability of the Existing Literary Sources on Sixth-century Athenian Politician: Solon

**Darshani Wickramasinghe**

ක්‍රි. පූ. 7 වන සියවස මුළු මහත් ග්‍රීසියට ම සමාජීය හා දේශපාලනික ව්‍යාකූලත්වයක් හා නොසන්සුන් බවක් ගෙනදුන් යුගයකි. මේ යුගයේ දී ග්‍රීසියේ ඇතන්ස් නුවර ද අත්තනෝමතික පාලකයන්ගේ නැගිටීම, ආර්ථික ව්‍යසන, වංශවතුන් අතර සට්ටන හා නුදුරේ දී ම පිබිදීමට අර අදින විප්ලව යනාදියෙන් පීඩාවට පත් විය. ප්‍රභූවරු හා සාමාන්‍ය ජනතාව එක හා සමාන ව එකල බලයේ පැවති පාලන ව්‍යූහයට අකමැත්ත ප්‍රකාශ කළෝ ය. මෙනිසා ඇතන්ස්හි වැසියෝ පැවති දේශපාලනික අස්ථිර බවට විසඳුම් සොයන අරමුණෙන් සෝලෝන් නමැති වංශාධිපතියා ක්‍රි.පූ. 594 දී ව්‍යවධායකයෙකු - an archon ලෙස පත් කළෝ ය. ඇතන්ස්හි දේශපාලනික, ආර්ථික දුෂ්කරතාවන්ට විසඳුම් වශයෙන් සෝලෝන් නව නීති සහ නව අධිකරණයක් ස්ථාපනය කළ අතර සියලු ම ඇතීනියානුවන්ට එක හා සමාන ලෙස බලපවත්නා නව ව්‍යවස්ථාවක් ද පිහිටුවේය. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ සෝලෝන් හා ඔහුගේ ප්‍රතිසංස්කරණ පිළිබඳ ලියවුණු දැනට ඉතිරි වී තිබෙන මූලාශ්‍රයවල විශ්වසනීයත්වය විශ්ලේෂණය කිරීමයි. සෝලෝන් විසින් ම රචිත ඔහු ගැන ලියවුණු පද්‍ය කාව්‍යයක් හැරෙන්නට ඔහුගේ ප්‍රතිසංස්කරණ පිළිබඳ සමකාලීන වූ ඓතිහාසික මූලාශ්‍රය කිසිවක් නැති අතර ඉතිරි ව පවතින්නේ ලිඛිත මූලාශ්‍රයයන් ය. මේවා අතුරින් ඇරිස්ටෝටල්ගේ 'ඇතීනියන් කොන්ස්ටිටියුෂන්' සහ ප්ලූටාර්ක්ගේ ''ලයිව්ස් ඔෆ් නෝබල් ග්‍රේෂියන්ස් ඇන්ඩ් රෝමන්ස්'' නමැති කෘති සෝලෝන්ගේ ව්‍යවස්ථාව පිළිබඳ විචාරාත්මක සටහන් තබයි. ලයිසියෑස්, අයිසොක්‍රටීස්, ඩිමොස්තිනීස් සහ ජුලියස් පොලාක්ස් වැනි වාගාලංකාරකයන්ගේ දැනට සංරක්ෂණය කර ඇති

© **Lecturer Darshani Wickramasinghe**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය